# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2138/3 - 2019 අගෝස්තු මස 26 වැනි සඳුදා - 2019.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥා පනත**

නිවේදනයයි

**පෙර පාසැල් සේවා කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33 (1) (අ) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 2000 පෙබරවාරි මස 21 වැනි දින අංක 1120/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව ඉහත කී ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ ඔහු විසින් පෙර පාසැල් සේවා කර්මාන්තයේ නියුක්ත ගුරුවරුන් සහ සහයකයින් සම්බන්ධයෙන් පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අවම වේතන ප්‍රමාණය පිළිබඳව කරන ලද තීරණය ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 33 (3) වන වගන්තිය සමග කියවෙන 29(3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2019 සැප්තැම්බර් මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

**ආර්. පී. ආර්. රාජපක්ෂ,**
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 අගෝස්තු මස 20 වැනි දින,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය,
කොළඹ 05.

*උපලේඛනය*

කම්කරු කොමසාරිස් විසින් පෙර පාසැල් කර්මාන්තයෙහි නියුක්ත ගුරුවරු හා සහායකයින්ගේ කාල මිම්මේ වැඩ සඳහා වන අවම වේතනවලට අදාළව කරන ලද 2000 ජූනි මස 30 වැනි දින අංක 1138/29 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

*අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තා වූද කලින් කල වෙනස් කරන ලද්දා වූද අවසන් වරට 2013 ජනවාරි මස 22 වැනි දින අංක 1794/11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපලේඛනයට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

| *පළමුවන තීරය (ප්‍රදේශය)* | *දෙවන තීරය (වෘත්තිය)* | *තුන්වන තීරය (අවම මාසික වේතනය)* |
|---|---|---|
| මහ නගර සභා සීමාව තුළ | (අ) ගුරුවරුන්<br>(ආ) සහායකයින් | 13,500.00<br>11,500.00 |
| නගර සභා සීමාව තුළ | (අ) ගුරුවරුන්<br>(ආ) සහායකයින් | 12,750.00<br>11,000.00 |
| ප්‍රාදේශීය සභා සීමාව තුළ | (අ) ගුරුවරුන්<br>(ආ) සහායකයින් | 11,250.00<br>10,000.00 |

ඉහත (ආ) සළකුණෙන් දැක්වෙන සේවාවන්ට ඉහත (අ) සළකුණෙන් දැක්වෙන සේවාවට අනුෂාංගික වූ කිසියම් සේවාවක් වේ නම් ඒවා ද ඇතුළත් වේ.

09-316/1

---

## පඩිපාලක සභා ආඥාපනත

## නිවේදනයයි

### වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1)(අ) වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 1979 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 58 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව ඉහත කී ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ ඔහු විසින් වීදුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය පිළිබඳව කරන තීරණය කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 33(3) වන වගන්තිය සමග කියවෙන 29(3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2019 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

**ආර්. පී. ආර්. රාජපක්ෂ,**
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ 05,
කම්කරු මහ ලේකම් කාර්යාලයේ දී ය.

### *උපලේඛනය*

කම්කරු කොමසාරිස් විසින් වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ කාල මිම්මේ වැඩ සඳහා වන අවම වේතන වලට අදාළව කරන ලද 1980 ජූනි මස 26 වැනි දින අංක 94/6 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තා වූද, කලින්කල වෙනස් කරන ලද්දා වූද අවසන් වරට 2013 ජනවාරි මස 22 වැනි දින අංක 1794/11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූද තීරණ එම උපලේඛනයට පහත කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කරනු ලැබේ.

වීදුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි නියුක්ත I වැනි තීරුවේ සඳහන් කම්කරුවන් හට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වැනි තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන පරිදි විය යුතුය.

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|
| | *සේවක පන්තිය* | *වැඩ කරන දවස් සඳහා වූ වේතන ප්‍රමාණය රු. ශත* |
| *(අ)* | පිඹුම්කරු, යන්ත්‍රකරු | 675.00 |
| *(ආ)* | සහාය යන්ත්‍ර ක්‍රියාකරු, බුබුළුකරු, කැපුම්කරු, සහාය පිඹුම්කරු, උඳුන්කරු | 600.00 |
| *(ඇ)* | ගිනියම්කර මට්ටම් කරන්නා, හුලං ගහන්නා, බර ඇසුරුම්කරු, සහාය බුබුලුකරු | 570.00 |
| *(ඈ)* | කණිෂ්ඨ බුබුලුකරු, හැඩ සමකරන්නා, හරවන්නා, ගණන් කරන්නා | 550.00 |
| *(ඉ)* | කැපුම්කරු, විමිනි කැපුම්කරු, මට්ටම්කරු | 530.00 |
| *(ඊ)* | ඇසුරුම්කරු, ගෙනයන්නා | 500.00 |

09-316/2

---

## පඩිපාලක සභා ආඥාපනත

## නිවේදනයයි

### බීඩි සෑදීමේ කර්මාන්තය

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1)(අ) වැනි වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 2015 මැයි මස 27 වැනි දින අංක 1916/13 දරන *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව ඉහත කී ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ ඔහු විසින් බීඩි සෑදීමේ කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයේ දැක්වෙන කැලි මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය පිළිබඳව කරන තීරණය කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 33(3) වන වගන්තිය සමග කියවෙන 29(3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2019 සැප්තැම්බර් මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

**ආර්. පී. ආර්. රාජපක්ෂ,**
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 අගෝස්තු මස 20 වැනි දින,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය,
කොළඹ 05.

### *උපලේඛනය*

බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1957 නොවැම්බර් මස 29 වැනි දින අංක 11208 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයෙහි වූ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූද කලින් කළ වෙනස් කරන ලද්දා වූ බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභා අවම වැටුප් ප්‍රමාණයන් පිළිබඳ තීරණ අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 දිනැති අංක 1789/19 දරන *ගැසට් පත්‍රයේ* පළ කෙරිණි. 2015 මැයි මස 27 වැනි දින අංක 1916/13 දරන *ගැසට් නිවේදනය* මගින් මෙම කර්මාන්තයේ අවම වැටුප් ප්‍රමාණයන් තීරණය කිරීමේ බලය කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබීමෙන් අනතුරුව ගනු ලැබූ අවම වැටුප් ප්‍රමාණයන් පිළිබඳ II වැනි කොටසට අදාළ තීරණ පහත සඳහන් නිවේදනය කරනු ලැබේ.

## **II** වැනි කොටස

### කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණයන්

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ සූදනම් කිරීම, ඕතන කොළ කැපීම, ඕතන කොළ තැබීම, කැපූ එතුම් කොළ "බීඩි දුම්කොළ" වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි බැඳීම ඇතුළුව) බීඩි එතීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන්.

| | | |
|---|---|---|
| *(අ)* | දිග අඟල් 2ට නොවැඩි බීඩි 1,000 ක් | රු. 400.00 |
| *(ආ)* | දිග අඟල් 2ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1,000 ක් සඳහා | රු. 450.00 |
| *(ඇ)* | දිග අඟල් 3ට නොඅඩු බීඩි 1,000 ක් සඳහා | රු. 490.00 |

(කැපූ එතුම් කොළ "බීඩි දුම්කොළ" වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි බැඳීම ද ඇතුළුව එහෙත් බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ පිළියෙළ කිරීම සහ ඕතන කොළ කැපීම හැර) බීඩි එතීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන්.

| | | |
|---|---|---|
| *(අ)* | දිග අඟල් 2ට නොවැඩි බීඩි 1,000 ක් | රු. 300.00 |
| *(ආ)* | දිග අඟල් 2ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1,000 ක් සඳහා | රු. 340.00 |
| *(ඇ)* | දිග අඟල් 3ට නොඅඩු බීඩි 1,000 ක් සඳහා | රු. 375.00 |

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ පිළියෙල කිරීමද ඇතුළුව) ඕතන කොළ කැපීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන්

| | | |
|---|---|---|
| *(අ)* | දිග අඟල් 2ට නොවැඩි බීඩි 1,000 ක් | රු. 200.00 |
| *(ආ)* | දිග අඟල් 2ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1,000 ක් සඳහා | රු. 220.00 |
| *(ඇ)* | දිග අඟල් 3ට නොඅඩු බීඩි 1,000 ක් සඳහා | රු. 230.00 |

එතූ බීඩි වටා ලේබල් සවි කිරීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණය බීඩි 1,000 ට රු. 50.00 ක් විය යුතුය.

09-316/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.